ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>ජාත්‍යන්තර යුධ නෞකා දැක්ම සහ MILAN 2026 විශාඛාපට්නම් හිදී පැවැත්වේ</u>**

ඉන්දිය නාවික හමුදාව විසින් සංවිධානය කරනු ලබන ජාත්‍යන්තර යුධ නෞකා දැක්ම සහ MILAN 2026 යන සුවිශේෂී වැඩසහටහන් ද්විත්වය 2026 පෙබරවාරි 15 සිට 25 දක්වා පැවැත්වේ. විදේශ නියෝජිතයන් 75 දෙනෙකු, ගුවන් යානා 50ක් සහ නෞකා 71ක් මේ සඳහා සහභාගී වන අතර මිත්‍ර රටවල් 18ක යුධ නෞකා ද මෙයට ඇතුළත් වේ. මෙවර ජාත්‍යන්තර යුධ නෞකා දැක්ම 'සාගර හරහා එක්ව' යන තේමාව යටතේ ද MILAN අභ්‍යාසය 'මිත්‍රත්වය සහ සහයෝගීතාවය' යන තේමාව යටතේ ද පැවැත්වෙන අතර එහිදී වෘත්තීමය හුවමාරු, මෙහෙයුම් අභ්‍යාස සහ සංස්කෘතිකාංග ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

2. 2026 වසරේ වැඩසටහන තුළින් සහභාගීවන්නන්ට වරාය තුළ මෙහෙයුම් කටයුතු පිළිබඳ දැනුම සහ අත්දැකීම් බෙදා හදා ගැනීමට ද, මුහුදේ වෘත්තීය කුසලතා වැඩි දියුණු කර ගැනීමට ද, ක්‍රීඩා ක්ෂේත්‍රයන් හි මිත්‍රත්වය ශක්තිමත් කිරීමට ද ඉන්දිය සංස්කෘතිය පිළිබඳ අපූර්ව අත්දැකීමක් ලබා ගැනීමට ද වටිනා අවස්ථාවන් හිමි කර දෙනු ඇත.

3. ඉන්දියාවේ ගරු ජනාධිපතිනි ශ්‍රීමති ද්‍රෞපදී මුර්මු මැතිනිය 2026 පෙබරවාරි 18 වන දින උදෑසන විශාකාපට්නම් හිදී යුධ නෞකා දැක්ම සඳහා සහභාගී වන නෞකා සමූහය නිරීක්ෂණය කළාය. විවිධ මිත්‍ර රටවල සහ ඉන්දියාවේ නෞකා නැංගුරම් ලා තිබෙන අතරතුර ජනාධිපතිනියට ගරු කිරීමක් වශයෙන් නෞකා, සබ්මැරීන සහ ගුවන්යානා විශේෂ ආචාර පෙළපාලියක් ද පවත්වන ලදී. රුවල් නැව් පෙළපාලියක්, හෙලිකොප්ටර් යානා විසින් පවත්වන ලද සෙවීමේ සහ මුදවා ගැනීමේ නිරූපණයක් සහ නාවික නිලධාරීන් විසින් සිදු කරන ලද යුධ කුසලතා ප්‍රදර්ශනයක් යනාදිය ද ජාත්‍යන්තර යුධ නෞකා දැක්මට ඇතුළත් වේ.

4. ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් කාන්චන බානගොඩ මහතා ගරු ජනාධිපතිනිය සමඟ ඉන්දියාව විසින් නිෂ්පාදනය කරන ලද නාවික ගැඹුරු මුහුද අවේක්ෂණ නෞකාවක් වන INS සුමේධ නෞකාවේ සිට යුධ නෞකා නිරීක්ෂණයට එක් විය. එසේම, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සමීප කලාපීය සමුද්‍රීය සබඳතා අවධාරණය කරමින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ SLNS සාගර සහ SLNS නන්දිමිත්‍ර නෞකාවන් ද වැඩසටහන්වලට සහභාගී විය.

****

***කොළඹ***

***2026*** පෙබරවාරි ***19***